# ඔබාමා හා ජාතිය

බරක් හුසේන් ඔබාමා මහතා ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති පදවියෙහි දිවුරුම් දුන්නේ ය. එහෙත් ඒ මහතා දිවුරුම් දුන්නේ කළු ජනවාර්ගිකයකු ලෙසවත් අප්‍රිකානු අමරිකානු ජනවර්ගිකයකු ලෙසවත් නොව ඇමරිකානු පුරවැසියකු ලෙස ය. වෙනත් වචනවලින් කිවහොත් ඇමරිකානු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූවකු ලෙස ය. දිවුරුම් දීමේ උත්සවයේ සියළු වැඩ කටයුතු සිද්ධ වූයේ ඒ සංස්කෘතියෙහි ය. දිවුරුම් දීම සඳහා බයිබලය යොදා ගැණිනි. සියල්ල සිදු කෙරුණේ දෙවියන් වහන්සේගේ නාමයෙනි. වෙනත් සංස්කෘතියක ආගමක පුළුටක්වත් එහි දක්නට නො වී ය. එහි කිසිදු වරදක් නැත. ඇමරිකාවේ සිටින කිසිම බෞද්ධයකු හෝ ක්‍රිස්තියානි නොවන වෙනත් අයකු හෝ උත්සවයෙහි තම ආගමට හෝ සංස්කෘතියට හෝ ක්‍රිස්තියානියට ඇති තැන නැතැයි විරුද්ධත්වයක් පෑ බවට සඳහනක් නැත. අඩුම තරමින් එවැන්නකු කන්කෙඳිරි ගෑ බවට සාක්ෂියක් නැත. සංස්කෘතික සමානත්වයක් ගැන කිසිවකු දොඩා නැත. මෙරට පඬියන්ට ද ඒ පිළිබඳ වගක් නැත. රාජ්‍ය නොවන සංවිධාන එයට විරුද්ධත්වය පාමින් කොටුව දුම්රියපොළ ඉදිරියට හෝ ලිප්ටන් වටරවුමට එන බවක් දැනගැනීමට නැත.

බ්‍රිතානියේ හෝ යුරෝපයේ වෙනත් රටක හෝ සිදුවන්නේ ද ඉහත සඳහන් ආකාරයේ ම වූ ක්‍රියාවලියකි. ඒ කිසිම රටක විවිධ සංස්කෘතීන්ට යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා සම තත්වයෙහි ලා සැලකිය යුතු බවට කිසිම හඬක් නො නැගෙයි. එහෙත් ලංකාවේ එසේ නොවීම මහා භයානක කාර්යයක් ලෙස සැලකෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය ලෙස සැලකීමට පවා ඊනියා සුළු ජනවාර්ගිකයන්ගෙන් බොහෝ දෙනෙක් විරුද්ධ වෙති. එසේ සැලකීම මානව අයිතීන් කඩකිරීමක් ලෙස හැඳින්වෙයි. එහි දී ඔවුහු විවිධ පද යොදාගනිති. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ආධිපත්‍යයක් ඇතැයි කියැවෙයි. එසේත් නැත්නම් සිංහල අධිපතිවාදයක් ගැන සඳහන් කෙරෙයි. ඔබාමාගේ රටේ එක සංස්කෘතිය පිළිගන්නා ඔවුහු මෙරට බහු සංස්කෘතියක් ගැන කතාකරති. ඔවුන්ට අනුව අප රට ඇමරිකාවට වඩා සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක් අනුගමනය කළ යුතු ය. කුඩා කල ඉස්ලාම් භක්තිකයකු වූ ඔබාමාට ක්‍රිස්තියානි ආගම වැළැඳ ගැනීමට සැලැස්වූ සංස්කෘතියක නැති ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන බයිලා කියති.

ඔබාමා ක්‍රිස්තියානි නොවී ඉස්ලාම් භක්තිමතකු වී ඇමරිකානු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට බැණ වදිමින් බලය බෙදීමට උද්ඝෝෂණය කරමින් ඇමරිකාව වටේ ගියේ යැයි සිතමු. ඔහුට එවිට ඒ රටෙහි ජනාධිපති වීමේ කිසිදු ඉඩක් වී යැයි සිතන්නේ ද? ඇමරිකාවේ දකුණු ප්‍රාන්තවල කළු ජනවාර්ගිකයන්ට බලයට එමට හැකිවන පරිදි බලය බෙදිය යුතු යැයි ඔබාමා කියා සිටියේ නම් සුදු ඇමරිකානුවන් ඔබාමා මුහුදෙහි හෝ ගඟක හෝ ඔබනු ඇත. ඔබාමා මුළුමනින් ම ඇමරිකානු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූවෙකි. ඔහු ඇමරිකාවේ ජනාධිපති පදවියට පත් කළු ජාතිකයෙක් නො වෙයි. ඔහු අප්‍රිකානු සම්භවයක් ඇති එහෙත් ඇමරිකානු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මුළුමනින් ම වැළඳගත් ඇමරිකානුවෙකි. ඔබාමා ඉංගිරිසි බස උච්චාරණය කරන්නේ උගත් සුදු ඇමරිකානුවකු ඒ බස උච්චාරණය කරන අන්දමට මිස සාමාන්‍ය කළු ඇමරිකානුවකු ඉංගිරිසි උච්චාරණය කරන අයුරින් නො වේ. සුදු ඇමරිකානුවන් ඡන්දය දුන්නේ ඒ ඇමරිකානුවාට මිස කළු ජනවාර්ගියකුට නො වෙයි.

අප මේ වෙනස සංකල්පීය ව හඳුනාගැනීමට උත්සාහ දැරිය යුතු ය. බටහිරයන් ලෝකයේ තමන් දරණ ආධිපත්‍යය යොදාගනිමින් ඔබාමා ඇමරිකාවේ ජනාධිපති පදවියට පත් පළමු කළු ජනවාර්ගිකයා ලෙස ලෝකයාට හඳුන්වාදීමට උත්සාහ දරණ බව පැහැදිලි ය. එමගින් ඔවුන් කරන්නේ තම සංස්කෘතික ආධිපත්‍යය සැඟවීම ය. ඇමරිකාවේ ජීවත්වන කළු ජනවාර්ගිකයන්ට ඒ ඒ ප්‍රමාණයට ඇමරිකානු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වැළඳගනු හැරෙන්නට වෙනත් විකල්පයක් නැත. මෙහි දී සිදුවන්නේ කළු ජනවාර්ගිකයන්ට තැනක් දීම නොව කළු ජනයා මත ක්‍රමයෙන් සුද්දන්ගේ ඇමරිකානු සංස්කෘතිය පැටවීම ය. ඔබාමා යනු එසේ සුදු ඇමරිකානු සංස්කෘතිය මුළුමනින් ම පටවනු ලැබූ කළු ජනවාර්ගිකයෙකි. ඔහුට අද ආපසු කෙන්යාවට ගොස් කීවත්විය නො හැකි ය. ඔහු බුෂ් මෙන් ම කෙන්යාවට ආගන්තුකයෙකි.

අද ඇමරිකාවේ ජීවත්වන විවිධ දක්ෂතා හේතුවෙන් ප්‍රසිද්ධියට පත් කළු ජනවාර්ගිකයෝ බොහෝ දෙනෙක් ද ඒ ගණයට අයත්වෙති. ඇමරිකාවේ හිටපු රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස්, අභාවප්‍රාප්ත මාර්ටින් ලූතර් කිං (කණිෂ්ඨ),

© Prof. Nalin De Silva

මයිකල් ජැක්සන් ආදීහු එවැන්නෝ වෙති. මේ අතර එසේ ප්‍රසිද්ධියට පත් සමහර අයට යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ බලපෑම පීඩාකාරී ලෙස දැනෙයි. ඔවුහු එවිට බොහෝ විට විරෝධාකල්පයකින් ඉස්ලාම් ආගම වැළඳ ගනිති. ඒ සමග ඇතැම් විට මුස්ලිම් නම් ද ලබාගනිති. බොක්සිං ක්‍රීඩකයකු වූ මොහොමඩ් අලි එවැන්නෙකි. සුප්‍රසිද්ධ ගොල්ෆ් ක්‍රීඩකයකු වූ ටයිගර් වුඩ්ස් බුදුදහම වැළඳ ගෙන ඇත්තේ එවැනි ආකල්පයකින් දැයි නිශ්චිත ව කිවහැකි නො වේ. එහෙත් ඇමරිකානු සංස්කෘතියෙන් ඒ ඒ ප්‍රමාණයට වෙනස් වූ මේ එක් අයකුටවත් ඇමරිකාවේ ජනාධිපති විය නොහැකි බව නම් ඉතා පැහැදිලි ය.

අද අපි ලංකාවේ ඉතිහාසයේ සන්ධිස්ථානයකට පැමිණ ඇත්තෙමු. දශක තුනක් තිස්සේ අපට හිසරදයක් වූ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයකිරීමේ ඓතිහාසික මොහොත නොබෝ දිනකින් එළඹීමට නියමිත ය. එහෙත් අවසාන මොහොතේ දී ද බටහිරයන් හා ඉන්දියානු ඔත්තු සේවය වූ රෝ සංවිධානය එයට අකුල් හෙළීමට ඉඩ ඇති බැවින් ඉතා සෝදිසියෙන් සිටිය යුතු ය. පසුගිය දා මුලතිවු ප්‍රදේශයට දෙවතාවක් පැමිණ ඇති රෝ ගුවන්යානා ලංකාණ්ඩුවේ ඉල්ලීමට පැමිණි එවා යැයි කිව නො හැකි ය. අනෙක් අතට රෝ සංවිධානය ඇතැම් විට ඉන්දීය ආණ්ඩුවෙන් ද ස්වාධීන ව ක්‍රියා කරයි. ඔවුන් බටහිරයන් සමග එකතුව ක්‍රියාකරන අවස්ථා ද ඇත. පසුගිය දා සිදු වූ සිරස ඊනියා ගිනි තැබීම හා ලසන්ත ඝාතනය ද ආණ්ඩුවේ කටයුතු අවුල් කර මැදිහත් වීමකට ඉඩ සලසනු වස් මේ අය විසින් සැලසුම් කරන ලද්දක් විය හැකි ය. කිලිනොච්චිය අවට පෙදෙස්වල ගුවන්පථ පහක් හෝ හයක් හෝ ඉදිකර ඇත්තේ හුදෙක් කොටි සංවිධානයේ ප්‍රයෝජනය සඳහා යැයි අපි විශ්වාස නො කරමු. පසුගිය මාස කිහිපයක කාලයෙහි අපේ අහසෙහි පියාසර කළ සැහැල්ලු ගුවන්යානා ද කොටින්ගේ ගුවන්යානා නොවීමට ඇති ඉඩකඩ අධික ය.

ඒ කෙසේ වෙතත් දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය පැරදවීම යනු ප්‍රශ්නයේ අවසානය නො වේ. දෙමළ ජාතිවාදය පැරදවීමේ කාර්යය ඊළඟට වෙයි. දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය යනු දෙමළ ජාතිවාදයේ එක් අංගයක් පමණක් වෙයි. ජීවිත දහස් ගණනක් විනාශ කරමින් දශක තුනක් තිස්සේ කරන ලද ත්‍රස්තවාදී ක්‍රියාවලට අවසාන වශයෙන් වගකිව යුත්තේ ලන්දේසීන් හා ඉංගිරිසින් විසින් ඇතිකරන ලදුව ඉංගිරිසින් විසින් පෝෂණය කරන ලද දෙමළ ජාතිවාදය ය. එහි දී චෙල්වනායගම්ලා විවිධ පොන්නම්බලම් ලා, අමිර්තලිංගම් ලා පමණක් නොව අපේ කොල්ලන් ලෙස කොටින් හැඳින් වූ ආනන්ද සංගරීලා ද වගකිවයුත්තෝ වෙති. මෙහි දී ලංකා ගාන්ධි ලෙස හැඳින්වෙන චල්වනායගම් හා ගාන්ධි ගැන වචනයක් කිව යුතු ය. ඔවුහු අහිංසාවාදියෝ නො වූහ. ඊනියා අහිංසාවාදී ව්‍යාපාරවලින් ජනතාව සෘජුව හෝ වක්‍රව හෝ හිංසාවාදී ක්‍රියාවන්ට පෙළඹවෙන්නේ නම් එහි ඇති අහිංසාවක් නැත. බුදුන්වහන්සේගේ ක්‍රියා නිසා ජනතාව කිසි විටෙකත් හිංසාවාදී ක්‍රියාවන්ට නැඹුරු නො වූහ. එහෙත් ගාන්ධි ව්‍යාපාරයෙන් ජනතාව ඇතැම් අවස්ථාවල හිංසාවට නැඹුරු කෙරිණි. චෙල්වනායගම් තම ඊනියා අහිංසාවාදී ව්‍යාපාර මුළුමනින් ම සංවිධානය කෙළේ දෙමළ ජනයා හිංසාව වෙතට දැක්කවීමට ය. ප්‍රභාකරන් බිහිවූයේ ම චෙල්වනායගම්ගේ දරුවකු ලෙස ය. පසුගිය දශක තුනේ ජීවිත හානිවලට චෙල්වනායගම් ද වගකිව යුතු ය. කිසිම විටෙක ගාන්ධි බුදුන් වහන්සේ සමග සංසන්දනය නොකළ යුතු ය. සිංහලයන්ට විරුද්ධව තම සතිඅන්ත කසිකබල් පුවත්පත මෙහෙය වූ ද බුදුන් වහන්සේ ගාන්ධි සමග සංසන්දනය කරන්නා වූ ද ඊනියා ගාන්ධිවාදියකු දැන් බොරුසිල් ගෙන තම ජඩමාධ්‍යවේදී සගයන් විවේචනයකිරීමට පටන්ගෙන ඇත. වැල යන අතට මැස්ස ගසන මොවුන්ගෙන් පරෙස්සම් විය යුතු ය.

බටහිරයන්ගේ අනුග්‍රහය ලැබූ චෙල්වනායගම්ලාගේ දෙමළ ජාතිවාදයේ අරමුණ වූයේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමි කිරීම ය. අවුරුදු තුන්සීයක පමණ කාලප්‍රාන්තරයක විහිදෙන දෙමළ ජාතිවාදය එක් වාක්‍යයකින් හැඳින්විය හැක්කේ එලෙස ය. ඇමරිකාවේ දී කළු ජනවාර්ගිකයන්ට ඇමරිකන් සුදු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වැළඳ ගෙන ඇමරිකන් ජාතියට ඇතුල්වීමට බලකරන බටහිරයෝ ලංකාවේ දී එහි අනෙක් පැත්ත ම කරති. ඔවුහු සිංලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදය බිහිකර පෝෂණය කර මෙරට දෙමළ ජනයාට හා මුස්ලිම් ජනයාට සිංහලයන් පඬුඅබා රජු දවස ගොඩනැගූ ජාතියට එක්වීමට ඉඩ නො දෙති. ඔවුහු ඔබාමාට ඇමරිකාවේ ජනාධිපති විය හැකි නම් ලංකාවේ දෙමළ ජනවාර්ගිකයකුට ජනාධිපතිවිය නොහැක්කේ ඇයි ද යන අමන පැණය නගති. ඔබාමා ඇමරිකන් ජාතිකයකු වන අතර බොහෝ දෙමළ නායකයන් සිංහල ජාතියට ගරහමින් ඊනියා බලය බෙදීමෙන් සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමි තැන අහිමිකිරීමට උත්සාහ කරන්නන් වීම එයට හේතුව වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva